ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | **ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව** |
| --- | --- |
| දිනය | **2017 දෙසැම්බර් මස 28 වැනි දින** |

## මුදල් ප්‍රතිපත්ති විවරණය : අංක 08 - 2017

පවතින සාර්ව ආර්ථික වාතාවරණය පිළිබඳව සලකා බලා දැනට පවතින මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය යෝග්‍ය බව 2017 දෙසැම්බර් මස 27 වැනි දින පැවති රැස්වීමේ දී මුදල් මණ්ඩලයේ අදහස වූ අතර, ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික දැනට පවතින මට්ටමේ නොවෙනස්ව පවත්වා ගැනීමට තීරණය විය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මහ බැංකුව ආර්ථිකයේ ප්‍රවණතා අඛණ්ඩව සමීපව අධීක්ෂණය කරනු ලබනු ඇති අතර, අවශ්‍ය පරිදි සුදුසු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගනු ඇත.

මුදල් මණ්ඩලයේ මෙම තීරණය සඳහා තුඩු දුන් ප්‍රධාන ආංශික වර්ධන ප්‍රවණතා පහත සඳහන් වේ.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ තාවකාලික ඇස්තමේන්තු අනුව, ශ්‍රී ලංකා ආර්ථිකය 2017 වසරේ තුන්වන කාර්තුව තුළ දී පුරෝකථනය කළ මට්ටමට වඩා අඩු වර්ධනයක් වාර්තා කළේය. ඒ අනුව, ශ්‍රී ලංකා ආර්ථිකය, 2017 වසරේ දෙවන කාර්තුව තුළ වාර්තා කළ සියයට 4.0 ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයට සාපේක්ෂව 2017 වසරේ තුන්වන කාර්තුව තුළ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 3.3 කින් වර්ධනය විය. තෙවන කාර්තුව තුළ වාර්තා වූ ආර්ථික වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් කර්මාන්ත සහ සේවා අංශයේ ක්‍රියාකාරකම්වල පැවති මන්දගාමී ප්‍රසාරණය හේතු වූ අතර, කාලගුණික අවහිරතා හේතුවෙන් කෘෂිකාර්මික අංශය අඛණ්ඩව සෘණ වර්ධනයක්

වාර්තා කළේය. නුදුරු කාලයේ දී ආර්ථික වර්ධනය තවදුරටත් මන්දගාමී මට්ටමක පැවතිය ද, අපනයන අඛණ්ඩව ඉහළ යෑම හා විදේශ ඍජු ආයෝජන සමඟ ආයෝජන වර්ධනය වීම හේතුවෙන් 2018 වසරේ දී ආර්ථිකය යථාතත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෘෂිකාර්මික අංශය නැවත යථාතත්ත්වයට පත්වීම ද 2018 වසරේ ආර්ථික ක්‍රියාකාරිත්වය සඳහා සහාය වනු ඇත.

2017 නොවැම්බර් මාසයේ දී මතුපිට උද්ධමනය අපේක්ෂිත ලෙස මන්දගාමී වූ නමුත්, දේශීය ආහාර මිල ගණන් ඉහළ යෑමේ බලපෑම පිළිබිඹු කරමින් ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද.) සහ කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.) මත පදනම් වූ මතුපිට උද්ධමනය තවදුරටත් ඉහළ මට්ටමක පවතියි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුගමනය කරනු ලබන දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයේ සඵලදායී බව පිළිබිඹු කරනු ලබන ඉල්ලුම් පීඩන පාලනය වීම හේතුවෙන් මූලික උද්ධමනය හිතකර මට්ටමක පැවතිණි. සැපයුම් අංශයේ අවහිරතා හේතුවෙන් ආහාර මිල ගණන් ඉහළ යෑම නුදුරු අනාගතයේ දී මතුපිට උද්ධමනය කිසියම් දුරකට ඉහළ මට්ටමක පැවතීම සඳහා බලපෑම් ඇති කළ හැකි අතර, 2018 වසරේ පළමු කාර්තුව අවසානයේ දී මතුපිට උද්ධමනය නැවතත් අපේක්ෂිත මට්ටම කරා ළඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට ප්‍රතිචාර දක්වමින්, අපේක්ෂා කරන ලද පරිදි වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට සපයනු ලබන ණය වර්ධනයෙහි මන්දගාමී වීම හේතුකොටගෙන 2017 නොවැම්බර් මාසයේ දී පුළුල් මුදල් සැපයුමේ වර්ධනය සැලකිය යුතු ලෙස අඩු විය. මේ අතර, ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ රජයේ සුරැකුම්පත් ඵලදා අනුපාතික අතර පැවති විෂමතාව නිවැරදි කරමින් රජයේ සුරැකුම්පත් ඵලදා අනුපාතික ඉහළම මට්ටමක සිට පහළ ගියේය. ඵලදා අනුපාතිකවල අඩු වීම අනුව, අනෙකුත් වෙළඳපොළ පොලී අනුපාතික තවදුරටත් පහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

වඩාත් නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමයක් ක්‍රියාවට නැංවීමෙහි බලපෑම කිසියම් දුරකට පෙන්නුම් කරමින්, අපනයන ආදායම් අඛණ්ඩව සිව්වන මාසයටත් අංක දෙකක මට්ටමේ වර්ධනයක් වාර්තා කරමින් එහි වර්ධන ප්‍රවණතාව නොකඩවා පවත්වාගෙන ගියේය. කෙසේ වෙතත්, ඉහළ අපනයන ආදායම්වල ධනාත්මක බලපෑම සීමා කරමින්, විශේෂයෙන්ම අයහපත් කාලගුණික තත්ත්ව හේතුවෙන් ඇති වූ සැපයුම් අංශයේ අවහිරතා හේතුකොටගෙන ඇති වූ ඉහළ ආනයන වියදම් හේතුවෙන් වසරේ පළමු මාස දහය තුළ සමුච්චිත වෙළඳ හිඟය පුළුල් විය. කෙසේ වෙතත්, විදේශ ගිණුම් මත වූ

පීඩනය යම්තාක් දුරකට සමනය කරමින්, විශේෂයෙන්ම රජයේ සුරැකුම්පත් වෙළඳපොළ සහ කොළඹ කොටස් වෙළඳපොළ සඳහා වූ ලැබීම් ලෙස මූල්‍ය ගිණුම වෙත අඛණ්ඩ ලැබීම් වාර්තා විය. 2017 දෙසැම්බර් මස දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකමෙහි සිව්වන වාරිකය ලැබීම සහ හම්බන්තොට වරාය මෙහෙයුම් කටයුතු පැවරීම වෙනුවෙන් ලද ලැබීම් ගෙවුම් තුලනය තවදුරටත් ශක්තිමත් කිරීමට උපකාරී විය. මෙම වර්ධනයන් මධ්‍යයේ සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එ.ජ. ඩොලර් බිලියන 1.7 ක සමුච්චිත ශුද්ධ විදේශ විනිමය මිලදී ගැනීම පිළිබිඹු කරමින්, 2017 දෙසැම්බර් මස අවසානය වන විට දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 7.8 ක් දක්වා ඉහළ යනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. 2017 දෙසැම්බර් 27 දින වන විට, එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල සියයට 1.9 කින් අවප්‍රමාණය විය. නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවක් වෙත ගමන් කිරීම සඳහා වූ වැඩිදියුණු කළ මුදල් ප්‍රතිපත්ති රාමුව යටතේ වඩාත් නම්‍යශීලී විදේශ විනිමය අනුපාතික ක්‍රමයක් පවත්වා ගෙන යන අතර, 2017 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව එතෙක් පැවති දළ නිල සංචිත ප්‍රමාණයෙහි අඩු වීමේ ප්‍රවණතාව වෙනස් කළ අතර, 2015 සහ 2016 යන වසරවල දී හිඟ මට්ටමක පැවති ගෙවුම් ශේෂය 2017 වසර තුළ දී අතිරික්තයක් දක්වා වර්ධනය කිරීමට සමත් විය.

දැනට පවතින දර්ශක අනුව, 2017 වසරේ මේ දක්වා කාලය තුළ විශේෂයෙන්ම ප්‍රාථමික ගිණුමේ අතිරික්තයක් වාර්තා කිරීමට හේතු වෙමින් ආදායම් රැස්කිරීම් ඉහළ යෑම හේතුවෙන් රාජ්‍ය මූල්‍ය අංශයේ කැපී පෙනෙන වර්ධනයක් සිදු විය. ප්‍රධාන වශයෙන් ඉහළ පොලී ගෙවීම් සහ සහන වැඩපිළිවෙළ ආශ්‍රිත වියදම්වල ප්‍රතිඵලයක් ලෙස මුල් ඇස්තමේන්තුවලට සාපේක්ෂව 2017 වසරේ දී ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන්හි යම් පසුබෑමක් අපේක්ෂා කළ ද, සාර්ව ආර්ථික ස්ථායීතාව පවත්වා ගෙන යෑමට දායක වෙමින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා වැඩපිළිවෙළ මැදි කාලයේ දී අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ඉහත කරුණු සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR), පිළිවෙළින්, සියයට 7.25 සහ සියයට 8.75 යන දැනට පවතින මට්ටමේ පවත්වා ගැනීමට මුදල් මණ්ඩලය තීරණය කළේය.

| **මුදල් ප්‍රතිපත්ති තීරණය:** | **ප්‍රතිපත්ති පොලී අනුපාතික නොවෙනස්ව පවතී** |
|---|---|
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) | සියයට 7.25 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) | සියයට 8.75 |
| ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR) | සියයට 7.50 |

**සංඛ්‍යා ඇමුණුම:**

### සංඛ්‍යා සටහන 01 : මූර්ත ද.දේ.නි.යේ වර්ධනය (තාවකාලික)

| ආර්ථික කටයුතු | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2016 | | | | | 2017 | | |
| | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව | වාර්ෂික | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව |
| **කෘෂිකාර්මික** | -0.2 | -5.7 | -2.0 | -8.4 | -4.2 | -3.0 | -3.4 | -3.3 |
| **කර්මාන්ත** | 9.1 | 2.0 | 5.9 | 9.2 | 6.7 | 6.3 | 5.2 | 1.9 |
| **සේවා** | 3.7 | 3.6 | 4.8 | 4.6 | 4.2 | 3.7 | 4.5 | 4.3 |
| **ද.දේ.නි.** | 5.1 | 2.4 | 4.6 | 5.3 | 4.4 | 3.9 | 4.0 | 3.3 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### සංඛ්‍යා සටහන 02: උද්ධමනය

| මාසය | | දෙසැ-16 | ජූනි-17 | ජූලි-17 | අගෝ-17 | සැප්-17 | ඔක්-17 | නොවැ-17 |
|---|---|---|---|---|---|---|---|---|
| **මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස)** | කො.පා.මි.ද. (2013=100) | 4.5 | 6.1 | 4.8 | 6.0 | 7.1 | 7.8 | 7.6 |
| | ජා.පා.මි.ද. (2013=100) | 4.2 | 6.3 | 6.3 | 7.9 | 8.6 | 8.8 | 8.4 |
| **මූලික උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස)** | කො.පා.මි.ද. (2013=100) | 5.8 | 5.1 | 4.9 | 6.0 | 6.0 | 5.8 | 5.2 |
| | ජා.පා.මි.ද. (2013=100) | 6.7 | 4.1 | 4.2 | 4.8 | 4.6 | 4.1 | 2.8 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### සංඛ්‍යා සටහන 03: මුදල් අංශයේ ප්‍රවණතා (තාවකාලික)

| දර්ශකය | ප්‍රමාණය (රුපියල් බිලියන) | | | | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | දෙසැ-16 | ජූනි-17 | සැප්-17 | ඔක්-17 | නොවැ-17 | දෙසැ-16 | ජූනි-17 | සැප්-17 | ඔක්-17 | නොවැ-17 |
| සංචිත මුදල් | 856 | 892 | 909 | 915 | 912 | 27.1 | 17.8 | 14.5 | 15.5 | 14.1 |
| පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) | 5,406 | 5,873 | 6,132 | 6,159 | 6,184 | 18.4 | 21.2 | 20.3 | 19.2 | 17.9 |
| ශුද්ධ විදේශීය වත්කම් | -231 | -246 | 10 | 37 | 67 | 22.4 | 50.0 | 103.8 | 113.2 | 123.5 |
| ශුද්ධ දේශීය වත්කම් | 5,637 | 6,119 | 6,122 | 6,122 | 6,117 | 15.9 | 14.7 | 13.9 | 12.3 | 10.5 |
| රජය වෙත ලබා දුන් ශුද්ධ ණය | 1,972 | 2,235 | 2,224 | 2,218 | 2,166 | 12.1 | 11.4 | 14.1 | 13.3 | 10.5 |
| රාජ්‍ය ව්‍යවසායන් සඳහා ලබා දුන් ණය | 495 | 551 | 498 | 476 | 483 | -5.3 | 13.7 | 10.0 | 3.5 | 2.9 |
| පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය | 4,204 | 4,505 | 4,659 | 4,700 | 4,762 | 21.9 | 18.6 | 17.5 | 16.2 | 15.4 |
| පුළුල් මුදල් සැපයුම ($M_4$) | 6,630 | 7,221 | 7,558 | 7,605 | 7,660 | 15.9 | 20.3 | 19.9 | 19.2 | 18.4 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන 04: පොලී අනුපාතික

| පොලී අනුපාතික (%) | 2016 දෙසැ. අවසානයට | 2017 මාර්තු අවසානයට | 2017 ජුනි අවසානයට | 2017 සැප්. අවසානයට | 2017 ඔක්. අවසානයට | 2017 නොවැ. අවසානයට | 2017 දෙසැ. 27 දිනට |
|---|---|---|---|---|---|---|---|
| **ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික** | | | | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 7.00 | 7.25 | 7.25 | 7.25 | 7.25 | 7.25 | 7.25 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 8.50 | 8.75 | 8.75 | 8.75 | 8.75 | 8.75 | 8.75 |
| **බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR)** | 8.42 | 8.75 | 8.75 | 8.11 | 8.15 | 8.13 | 8.15 |
| **භාණ්ඩාගාර බිල්පත් එලදා අනුපාතික (ප්‍රාථමික වෙළඳපොළ)** | | | | | | | |
| දින 91 | 8.72 | 9.63 | 9.60 | 8.71 | 8.75 | 8.20 | 7.69 |
| දින 182 | 9.63 | 10.62 | 10.29 | 9.01 | 9.10 | 8.88 | 8.30 |
| දින 364 | 10.17 | 10.98 | 10.47 | 9.10 | 9.48 | 9.44 | 8.90 |
| **ණය අනුපාතික** | | | | | | | |
| බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය (AWPR) (සතිපතා) | 11.52 | 11.79 | 11.70 | 11.55 | 11.25 | 11.43 | 10.92 |
| බරිත සාමාන්‍ය ණය අනුපාතිකය (AWLR) | 13.20 | 13.40 | 13.73 | 13.83 | 13.89 | - | - |
| බරිත සාමාන්‍ය නව ණය අනුපාතිකය (AWNLR) | 14.37 | 14.54 | 14.90 | 14.75 | 14.97 | - | - |
| **තැන්පතු අනුපාතික** | | | | | | | |
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) | 8.17 | 8.81 | 9.13 | 9.25 | 9.22 | 9.19 | - |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR) | 10.46 | 11.38 | 11.66 | 11.81 | 11.72 | 11.69 | - |
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR) | 11.17 | 11.49 | 11.57 | 10.63 | 10.75 | - | - |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව